# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1979 අංක 32 දරන
# සේවක මණ්ඩල පනත

[සහතිකය සටහන් කළේ 1979 මැයි මස 23 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1979 ජූනි මස 08 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක

මිළ : රු. 1.10 යි  තැපැල් ගාස්තුව : ශත 50 යි

# 1979 අංක 32 දරන සේවක මණ්ඩල පනත

[සහතිකය සටහන් කළේ 1979 මැයි මස 23 වන දින]

එල්. ඩී.—ඕ. 48/78.

රාජ්‍ය ව්‍යාපාරවල සේවක මණ්ඩල පිහිටුවීම සඳහා සහ ඒ මණ්ඩලවල කර්තව්‍ය නිශ්චය කර දැක්වීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද ඒ ව්‍යාපාරවල පාලක මණ්ඩලවලට සේවා නියුක්තයන් සහභාගි කරවා ගැනීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. (1) මේ පනත 1979 අංක 32 දරන සේවක මණ්ඩල පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය හා ක්‍රියාත්මක වීමේ දිනය.

(2) මේ පනතේ විධිවිධාන, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන යම් දිනයක හෝ කලින් කල නියම කරනු ලබන දිනවල හෝ ක්‍රියාත්මක විය යුතු ය. මේ පනතේ වෙන් වෙන් කොටස් ක්‍රියාත්මක වීම සඳහා වෙන් වෙන් දින අමාත්‍යවරයා විසින් නියම කරනු ලැබිය හැකි ය.

2. (1) ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින්, ඒ නියමයේ නිශ්චිතව සඳහන් රාජ්‍ය ව්‍යාපාර යම් පංතියකට හෝ වර්ගයකට අයත් සෑම රාජ්‍ය ව්‍යාපාරයකට ම, මේ පනතේ විධිවිධාන අදාළ විය යුතු බව, ප්‍රකාශ කළ හැකි ය. මේ පනත අදාළවීම.

(2) (1) වන උපවගන්තිය යටතේ කරන ලද නියමයක් ප්‍රකාර මේ පනතේ විධිවිධාන අදාළ වන සෑම රාජ්‍ය ව්‍යාපාරයක් ම මෙහි මින් මතු "නිශ්චිත ව්‍යාපාරය" යනුවෙන් සඳහන් කරනු ලැබේ.

## I වන කොටස

### ප්‍රාරම්භය

3. (1) මේ පනතෙහි අන්‍යාකාරයෙන් විධිවිධාන සලස්වා ඇත් නම් මිස, (මෙහි මින් මතු "කොමසාරිස්වරයා" යනුවෙන් සඳහන් කරනු ලබන) කම්කරු කොමසාරිස්වරයා මේ පනතේ සාමාන්‍ය කාර්ය පරිපාලනය භාරව සිටිය යුතු ය. මේ පනතේ කාර්ය පරිපාලනය.

(2) මේ පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ හෝ බලගැන්වීමේ කාර්යය සඳහා අවශ්‍ය විය හැකි නියෝජ්‍ය කම්කරු කොමසාරිස්වරයන්, ජ්‍යෙෂ්ඨ සහකාර කම්කරු කොමසාරිස්වරයන් හා සහකාර කම්කරු කොමසාරිස්වරයන් සහ වෙනත් නිලධරයන් යම් සංඛ්‍යාවක් පත් කරනු ලැබිය හැකි ය.

(3) ස්වකීය බලතල, කර්තව්‍ය හා කාර්ය ක්‍රියාත්මක කිරීමේ දී හා ඉටු කිරීමේ දී සෑම නියෝජ්‍ය කම්කරු කොමසාරිස්වරයකු ම, සෑම ජ්‍යෙෂ්ඨ සහකාර කම්කරු කොමසාරිස්වරයකු ම සහ සෑම සහකාර කම්කරු කොමසාරිස්වරයකු ම කොමසාරිස්වරයාගේ සාමාන්‍ය හෝ විශේෂ විධානවලට යටත් විය යුතු ය.

2—ඒ 40758—13,350 (79/05)

*මේ පනතේ විධිවිධාන වෙනත් යම් පනතක විධිවිධාන වලට අතිරේකව මිස ඒ විධිවිධාන හීන කිරීම සඳහා නොවිය යුතු බව.*

4. මේ පනතේ විධිවිධාන, වෘත්තිය සමිති ආඥාපනතේ හෝ සේවායෝජකයන්ට හෝ සේවා නියුක්තයන්ට අදාළ වෙනත් යම් නීතියක හෝ විධිවිධානවලට අතිරේකව මිස, ඒ විධිවිධාන හීන කිරීම සඳහා නොවිය යුතු ය.

*මේ පනතේ විධිවිධානවලට පටහැනි එකඟ වීම් ශූන්‍ය හා බලරහිත බව.*

5. මේ පනතින් සේවා නියුක්තයකු වෙත පිරිනැමුණු යම් අයිතිවාසිකමකට ඔහුට අවාසිවන පරිදි කවර හෝ ආකාරයකින් බලපාන හෝ එවැනි යම් අයිතිවාසිකමක් ඔහුට අවාසිවන පරිදි කවර හෝ ආකාරයකින් වෙනසකට ලක් කරන නැතහොත් මේ පනතින් සේවායෝජකයකු වෙත පැවරුනු යම් වගකීමක් කවර හෝ ආකාරයකින් ඉවත් කරන හෝ අඩු කරන වාචික වූ හෝ ලිඛිත වූ හෝ නැතහොත් ප්‍රකාශිත වූ හෝ ගම්‍යමාන වූ හෝ යම් එකඟවීමක්. ඒ අයිතිවාසිකම කෙරෙහි බලපාන තාක් ප්‍රමාණයට හෝ ඒ අයිතිවාසිකම වෙනසකට ලක් කරන තාක් ප්‍රමාණයට නැතහොත් ඒ වගකීම ඉවත් කරන හෝ අඩු කරන තාක් ප්‍රමාණයට ශූන්‍ය හා බලරහිත විය යුතු ය.

## II වන කොටස

### සේවක මණ්ඩල පිහිටුවීම

*සේවක මණ්ඩල පිහිටුවීම.*

6. යම් නිශ්චිත ව්‍යාපාරයකට මේ පනතේ විධිවිධාන අදාළවීම ආරම්භ වූයේ යම් දිනයක ද ඒ දිනයේ සිට මාස හයක් ඇතුළත එවැනි සෑම ව්‍යාපාරයක ම (මෙහි මින් මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) සේවක මණ්ඩලයක්, මේ කොටසේ විධිවිධානවලට යටත්ව, පිහිටුවනු ලැබිය යුතු ය.

*ප්‍රථම ඡන්ද මණ්ඩලය සංස්ථාපනය කිරීම.*

7. (1) සෑම නිශ්චිත ව්‍යාපාරයක් වෙනුවෙන් ම වූ ප්‍රථම ඡන්ද මණ්ඩලය කොමසාරිස්වරයා විසින් පත් කරනු ලැබිය යුතු ය. ඒ ඡන්ද මණ්ඩලය සාමාජිකයන් පස් දෙනකුගෙන් සමන්විත විය යුතු අතර එයින් දෙදෙනකු සුදුසුකම් ලත් ඒ ව්‍යාපාරයේ සේවා නියුක්තයන් විය යුතු ය. කොමසාරිස්වරයා විසින් එක් සාමාජිකයකු ඡන්ද මණ්ඩලයේ සභාපති ලෙස පත් කරනු ලැබිය යුතු ය.

(2) යම් නිශ්චිත ව්‍යාපාරයකට මේ පනතේ විධිවිධාන අදාළවීම ආරම්භ වූයේ යම් දිනයක ද ඒ දිනයේ සිට සති හයක් ඇතුළත ඒ ව්‍යාපාරයේ ප්‍රථම ඡන්ද මණ්ඩලය සංස්ථාපනය කරනු ලැබිය යුතු ය.

*කොමසාරිස්වරයා ඡන්ද මණ්ඩලය පත් කළ යුතු බව.*

8. සේවක මණ්ඩලයේ ධුර කාලය ඉකුත්වීමට සති හයකට නොඅඩු කාලයකට පෙර කොමසාරිස්වරයා විසින් ඡන්ද මණ්ඩලයක්, පත් කරනු ලැබිය යුතු ය. ඒ ඡන්ද මණ්ඩලය සුදුසුකම් ලත් සේවා නියුක්තයන් පස් දෙනකුගෙන් සමන්විත විය යුතු අතර එයින් එක් සේවා නියුක්තයකු ඒ ඡන්ද මණ්ඩලයේ සභාපති ලෙස පත් කරනු ලැබිය යුතු ය.

9. යම් නිශ්චිත ව්‍යාපාරයක සුදුසුකම් ලත් සෑම සේවා නියුක්තයකුට ම ඒ ව්‍යාපාරයේ පිහිටුවන ලද මණ්ඩලයට තෝරා පත් කර ගනු ලැබීමට ද මණ්ඩලයට සාමාජිකයන් තෝරා පත් කර ගැනීමේ ඡන්ද විමසීම්වල දී ඡන්දය දීමට ද හිමිකම තිබිය යුතු ය. මණ්ඩලයට තෝරා ගනු ලැබීමට ද මණ්ඩලයේ ඡන්ද විමසීම් වල දී ඡන්දය දීමට ද සේවා නියුක්තයන්ගේ සුදුසුකම්.

10. නිශ්චිත ව්‍යාපාරයක මණ්ඩලයක, ඒ ව්‍යාපාරයේ නිත්‍ය සේවයෙහි නියුක්ත සුදුසුකම් ලත් සේවා නියුක්තයන් සංඛ්‍යාව අනුව පහත දැක්වෙන ආකාරයට නිශ්චය කරනු ලබන සාමාජික සංඛ්‍යාවකින් සමන්විත විය යුතු ය:— මණ්ඩලයක් සංයුක්ත වන සාමාජික සංඛ්‍යාව.

(අ) සුදුසුකම් ලත් සේවා නියුක්තයන්ගේ සංඛ්‍යාව පනහ නොඉක්මවන අවස්ථාවක, මණ්ඩලය සාමාජිකයන් තිදෙනකුගෙන් සමන්විත විය යුතු ය;

(ආ) සුදුසුකම් ලත් සේවා නියුක්තයන්ගේ සංඛ්‍යාව පනහ ඉක්මවන නමුත් එකසිය පනහ නොඉක්මවන අවස්ථාවක මණ්ඩලය සාමාජිකයන් පස් දෙනකුගෙන් සමන්විත විය යුතු ය;

(ඇ) සුදුසුකම් ලත් සේවා නියුක්තයන්ගේ සංඛ්‍යාව එකසිය පනහ ඉක්මවන නමුත් තුන්සියය නොඉක්මවන අවස්ථාවක, මණ්ඩලය සාමාජිකයන් හත් දෙනකුගෙන් සමන්විත විය යුතු ය;

(ඈ) සුදුසුකම් ලත් සේවා නියුක්තයන්ගේ සංඛ්‍යාව තුන්සියය ඉක්මවන නමුත් හයසියය නොඉක්මවන අවස්ථාවක, මණ්ඩලය සාමාජිකයන් නව දෙනකුගෙන් සමන්විත විය යුතු ය;

(ඉ) සුදුසුකම් ලත් සේවා නියුක්තයන්ගේ සංඛ්‍යාව හයසියය ඉක්මවන නමුත් එක් දහස නොඉක්මවන අවස්ථාවක, මණ්ඩලය සාමාජිකයන් එකළොස් දෙනකුගෙන් සමන්විත විය යුතු ය; තව ද

(ඊ) සුදුසුකම් ලත් සේවා නියුක්තයන්ගේ සංඛ්‍යාව එක් දහස ඉක්මවන අවස්ථාවක, මණ්ඩලය සාමාජිකයන් දහඅට දෙනකුගෙන් සමන්විත විය යුතු ය.

11. මණ්ඩලයක සෑම සාමාජිකයකු ම, නිශ්චිත ව්‍යාපාරයේ සුදුසුකම් ලත් සේවා නියුක්තයන් විසින් රහස් ඡන්දයෙන් තෝරා පත් කර ගනු ලැබිය යුතු ය. මණ්ඩලයේ සාමාජිකයන් තෝරා පත් කර ගනු ලබන අන්දම.

12. (1) පහත දැක්වෙන කාරණා සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් රීති සාදනු ලැබිය හැකි ය:— රීති සෑදීමට අමාත්‍යවරයාට ඇති බලය.

(අ) සේවක මණ්ඩලවල සාමාජිකයන් තෝරා පත් කර ගනු ලබන ආකාරය හා කාර්ය පටිපාටිය;

(ආ) විවිධ වර්ගවලට අයත් සේවා නියුක්තයන් මණ්ඩලයක නියෝජනය කිරීම;

(ඇ) ව්‍යාපාරයක අංශ හෝ ශාඛා, ඒ ව්‍යාපාරය වෙනුවෙන් පිහිටු වන ලද මණ්ඩලයක නියෝජනය කිරීම ; සහ

(ඈ) ඉහත කී කාරණා අතුරින් යම්කිසි කාරණාවලට ආනුෂංගික හෝ ඒ හා සම්බන්ධ යම් කාරණයක්.

(2) අමාත්‍යවරයා විසින් සාදනු ලැබූ රීතිවලින් සෑම නිශ්චිත ව්‍යාපාරයක්ම, සේවා නියුක්තයන්, සේවායෝජක සහ මණ්ඩලය බැඳී සිටිය යුතු ය.

ඡන්ද මණ්ඩලයේ කර්තව්‍ය.

13. (1) මණ්ඩලයේ සාමාජිකයන් තෝරා පත් කර ගැනීමේ ඡන්ද විමසීම පැවැත්වීමේ කාර්යය සඳහා අවශ්‍ය සියලු ක්‍රියා හා සියලු දේ ඡන්ද මණ්ඩලය විසින් ඉටු කළ යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ පැවරී ඇති බලතලවල ව්‍යාප්තියට හානියක් නොමැතිව, ඡන්ද මණ්ඩලය විසින්—

(අ) මේ පනතෙහි ඇතුළත් විධිවිධානවල අරමුණ හා බලපෑම ද මණ්ඩලයේ ස්වභාවය සහ කර්තව්‍ය ද නිශ්චිත ව්‍යාපාරයේ සේවා නියුක්තයන්ට පැහැදිලි කර දීම ;

(ආ) මණ්ඩලයේ සාමාජිකයන් වශයෙන් තෝරා පත් කර ගැනීම් සඳහා අපේක්ෂකයන්ගේ නාම යෝජනා කැඳවීම සහ භාර ගැනීම ;

(ඇ) මණ්ඩලයේ සාමාජිකයන් තෝරා පත් කර ගැනීමේ ඡන්ද විමසීම් පිළියෙල කිරීම, පැවැත්වීම සහ අධීක්ෂණය කිරීම

කළ යුතු ය.

(3) ඡන්ද මණ්ඩලයක් පත් කරනු ලැබීමෙන් පසු සති හයක කාලයක් ඇතුළත එහි කර්තව්‍ය ඉටු කිරීම ඒ ඡන්ද මණ්ඩලය විසින් පැහැර හරිනු ලැබුවහොත්, කොමසාරිස්වරයා විසින් ඒ කර්තව්‍ය ඉටු කළ යුතු අතර, එවිට ඡන්ද මණ්ඩලය සම්බන්ධයෙන් වූ යම් සඳහන් කිරීමක් කොමසාරිස්වරයා සම්බන්ධයෙන් වූ සඳහන් කිරීමක් මෙන් මේ පනතේ විධිවිධාන අදාළ විය යුතු ය.

ව්‍යාපාරයක ශාඛාවක් හෝ අංශයක් ව්‍යාපාරයක් වන්නේ ද යනාදිය කොමසාරිස්වරයා විසින් නිශ්චය කළ යුතු බව.

14. මණ්ඩලයක් පිහිටුවීමේ කාර්යය සඳහා යම් ව්‍යාපාරයක් නිශ්චිත ව්‍යාපාරයක ශාඛාවක් ද නැතහොත් අංශයක් ද යන වග සම්බන්ධයෙන් හෝ යම් සේවා නියුක්තයකු සුදුසුකම් ලත් සේවා නියුක්තයකු ද නැද්ද යන වග සම්බන්ධයෙන් යම් ප්‍රශ්නයක් පැන නැගෙන අවස්ථාවක, ඒ ප්‍රශ්නය කොමසාරිස්වරයා විසින් නිශ්චය කරනු ලැබිය යුතු අතර කොමසාරිස්වරයා විසින් කරනු ලබන ඒ නිශ්චය කිරීම අවසානාත්මක විය යුතු ය.

ඡන්ද පෙත්සම්.

15. (1) ඡන්දය දීමේ සුදුසුකම් හා සම්බන්ධ යම් රීතියක් හෝ තෝරා පත් කර ගැනීමේ කාර්ය පටිපාටිය හා සම්බන්ධ යම් විධිවිධානයක් හෝ ඡන්ද විමසීම පැවැත්වීමේ දී උල්ලංඝනය කර ඇති බව යම් සුදුසුකම් ලත් සේවා නියුක්තයන් තුන්දෙනකුට හෝ ඊට වැඩි ගණනකට පෙනී යන්නේ නම්, ඡන්ද ප්‍රතිඵලය ප්‍රකාශ කිරීමෙන් දින දාහතරක් ඇතුළත ඒ ඡන්ද ප්‍රතිඵලයට විරුද්ධව කොමසාරිස්වරයා වෙත පෙත්සමක් ඉදිරිපත් කිරීමට ඔවුන්ට හිමිකම තිබිය යුතු ය.

(2) ඡන්දය දීමේ සුදුසුකම් හා සම්බන්ධ යම් රීතියක් හෝ තෝරා පත් කර ගැනීමේ කාර්ය පටිපාටිය හා සම්බන්ධ යම් විධිවිධානයක් හෝ උල්ලංඝනය කර ඇති බවට, කොමසාරිස්වරයා විසින් අවශ්‍ය යයි සලකන යම් පරීක්ෂණයකින් පසු ඔහු සෑහීමට පත් වන අවස්ථාවක, ඒ උල්ලංඝනය කිරීම හේතුකොටගෙන ඒ ඡන්ද විමසීමේ ප්‍රතිඵලය වෙනස් වී නොමැති බව නැතහොත් ඒ උල්ලංඝනය කිරීම ඒ ඡන්ද ප්‍රතිඵලය කෙරෙහි බලපා නොමැති බව ඔහුගේ මතය වන්නේ නම් මිස, ඔහු විසින් ඡන්ද විමසීම අවලංගු කළ යුතු ය.

(3) එවැනි පෙත්සමක් මත කොමසාරිස්වරයා විසින් කරනු ලබන නිශ්චය කිරීම අවසානාත්මක විය යුතු ය.

ඡන්ද විමසීම හා සම්බන්ධ වැරදි.

16. පහත සඳහන් යම් ක්‍රියාවක්, එනම්:—

(අ) මණ්ඩලයේ සාමාජිකයන් තෝරා පත් කර ගැනීමේ ඡන්ද විමසීමක් පැවැත්වීමට බාධා කරන;

(ආ) සුදුසුකම් ලත් සේවා නියුක්තයකුට ඡන්දය විමසීමක දී ඡන්දය පාවිච්චි කිරීමට හෝ ඡන්ද අපේක්ෂකයකු වශයෙන් ඉදිරිපත් වීමට ඇති අයිතිවාසිකම සීමා කරන;

(ඇ) යම් සුදුසුකම් ලත් සේවා නියුක්තයකුට යම් අවාසියක් කිරීමෙන් නැතහොත් ඔහු යම් අශක්තතාවකට භාජන කිරීමෙන් හෝ එසේ කිරීමට තර්ජනය කිරීමෙන් ඡන්ද විමසීමක් කෙරෙහි බලපෑමක් ඇති කිරීමට තැත් කරන;

(ඈ) යම් සුදුසුකම් ලත් සේවා නියුක්තයකුට යම් වාසියක් හෝ ප්‍රතිලාභයක් ලබා දීමෙන් හෝ ලබා දීමට පොරොන්දු වීමෙන් ඡන්ද විමසීමක් කෙරෙහි බලපෑමක් ඇති කිරීමට තැත් කරන

සෑම තැනැත්තෙක් ම වරදකට වරදකරු විය යුතු ය.

ඡන්ද විමසීමේ වියදම.

17. මණ්ඩලයකට සාමාජිකයන් තෝරා පත් කර ගැනීමේ ඡන්ද විමසීමේ වියදම නිශ්චිත ව්‍යාපාරය විසින් දැරිය යුතු ය.

වැටුප් අහිමිවීමක් නොමැතිව ඡන්දය දීම සඳහා සේවා නියුක්තයන්ට නිවාඩු දීම සේවා යෝජකයන්ගේ යුතුකම බව.

18. මණ්ඩලයක සාමාජිකයන් තෝරා පත් කර ගැනීමේ යම් ඡන්ද විමසීමක දී ඡන්දය දීමට හිමිකම් ඇති හෝ එවැනි යම් ඡන්ද විමසීමක දී අපේක්ෂකයකු වන හෝ ඡන්ද මණ්ඩලයක සාමාජිකයකුව, ඡන්ද මණ්ඩලයක සාමාජිකයකු වශයෙන් යම් කාර්යයක් ඉටු කිරීමට නියම වී ඇති හෝ වෙනත් යම් තැනැත්තකුගේ සේවා යෝජක වන යම් තැනැත්තකු විසින්, එකී වෙනත් යම් තැනැත්තා විසින් තත් කාර්යය සඳහා ලියවිල්ලකින් කරනු ලබන ඉල්ලීමක් මත, ඉහත කී කාර්ය අතුරින් කවර හෝ කාර්යයක් සඳහා අවශ්‍ය වන යම් කාලයක් වැටුප් අහිමිකමක් නොමැතිව එකී වෙනත් යම් තැනැත්තාට නිවාඩු දිය යුතු ය.

මණ්ඩලයක ධුර කාලය.

19. 20 වන වගන්තිය යටතේ මණ්ඩලයක ධුර කාලය කලින් අවසන් කරනු ලැබුවහොත් මිස, ඒ ධුර කාලය අවුරුදු දෙකක් විය යුතු ය.

ධුර කාලය කලින් අවසාන වන අවස්ථා.

20. (1) (අ) යම් මණ්ඩලයක ධුර කාලය ආරම්භ වීමේ දිනයෙන් එක් අවුරුද්දක් ගතවීමෙන් පසු යම් අවස්ථාවක, නිශ්චිත ව්‍යාපාරයේ නිත්‍ය සේවයෙහි නියුක්ත සුදුසුකම් ලත් සේවා නියුක්තයන්ගේ සංඛ්‍යාව දෙකෙන් පංගුවකින් වැඩි වී හෝ අඩු වී ඇති බව පෙනී යන්නේ නම්;

(ආ) යම් මණ්ඩලයක ධුර කාලය අවසාන කළ යුතු බව පැමිණ නොමැති සාමාජිකයන් ද ඇතුළුව මණ්ඩලයේ සාමාජිකයන්ගෙන් බහුතර සංඛ්‍යාවක් විසින් තීරණය කරනු ලබන්නේ නම්;

(ඇ) යම් මණ්ඩලයක් මේ පනතේ විධිවිධානවලට අනුකූලව කොමසාරිස්වරයා විසින් විසුරුවා හරිනු ලබන්නේ නම්

ඒ මණ්ඩලයේ ධුර කාලය අවසන් විය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ හෝ (ඇ) ඡේදයේ සඳහන් අවස්ථාගත කරුණු යටතේ මණ්ඩලයක ධුර කාලය අවසන් වන අවස්ථාවක, ඒ මණ්ඩලයේ ඒ අවස්ථාවේ පැවති සියලු කටයුතු අලුත් මණ්ඩලයක් තෝරා පත් කර ගනු ලබන තෙක් ඒ මණ්ඩලය විසින් කර ගෙන යා යුතු ය.

කොමසාරිස්වරයා විසින් මණ්ඩලය විසුරුවා හැරීම.

21. (1) යම් මණ්ඩලයක ව්‍යවස්ථාපිත කාර්ය ඉටුකිරීමෙහි ලා ඒ මණ්ඩලය විසින් බරපතල නොසැලකිල්ලකින් යුතුව කටයුතු කර ඇති බවට, අවශ්‍ය යයි තමා සලකන යම් පරීක්ෂණයකින් පසු, කොමසාරිස්වරයා සෑහීමකට පත්වන අවස්ථාවක, ඒ මණ්ඩලය විසුරුවා හරින ලෙස කොමසාරිස්වරයා විසින් නියම කළ හැකි ය.

(2) (1) වන උපවගන්තියෙහි විධිවිධාන සලස්වා ඇති පරිදි මණ්ඩලයක් විසුරුවා හරිනු ලැබූ අවස්ථාවක, ඒ නිශ්චිත ව්‍යාපාරයේ මණ්ඩලයේ සාමාජිකයන් තෝරා පත්කර ගැනීමේ ඡන්ද විමසීමක් පැවැත්වීමේ කාර්යය සඳහා ඡන්ද මණ්ඩලයක් කොමසාරිස්වරයා විසින් නොපමාව ම පත් කළ යුතු ය.

කොමසාරිස්වරයා විසින් මණ්ඩලයේ යම් සාමාජිකයකු ඉවත් කළ හැකි බව.

22. මණ්ඩලයේ යම් සාමාජිකයකු විසින් ස්වකීය ව්‍යවස්ථාපිත කාර්ය ඉටු කිරීමෙහි ලා බරපතල නොසැලකිල්ලට වරදකරු බව කියැවෙන, මණ්ඩලයේ සාමාජිකයන්ගෙන් තුනෙන් දෙපංගුවකට නොඅඩු සංඛ්‍යාවක් විසින් හෝ නිශ්චිත ව්‍යාපාරයක සුදුසුකම් ලත් සේවා නියුක්තයන්ගෙන් දෙකෙන් පංගුවකට වැඩි සංඛ්‍යාවක් විසින් හෝ අත්සන් කරන ලද සන්දේශයක් ලැබුණු විට, කොමසාරිස්වරයා විසින්, ඒ සාමාජිකයා ධුරයෙන් ඉවත් කරන ලෙස නියම කළ හැකි ය.

සාමාජිකත්වය අවසාන වීම.

23. මණ්ඩලයේ සාමාජිකයකුගේ ධුර කාලය, මණ්ඩලයේ ධුර කාලය ඉකුත් වූ විට හෝ ඒ සාමාජිකයා ඉල්ලා අස් වූ විට හෝ ඒ සාමාජිකයා නිශ්චිත ව්‍යාපාරයේ සුදුසුකම් ලත් සේවා නියුක්තයකුව සිටීම අවසාන වූ විට හෝ 21 වන හෝ 22 වන වගන්තිය යටතේ කොමසාරිස්වරයාගේ නියමයක් මත හෝ අවසාන විය යුතු ය.

24. (1) මණ්ඩලයේ ධූර කාලය ඉකුත් වීමෙන් හැර, අන්‍යාකාර යකින් ඒ මණ්ඩලයේ සාමාජිකයකුගේ සාමාජිකත්වය අවසාන වූ කවර හෝ විටෙක, කොමසාරිස්වරයා විසින් ඡන්ද මණ්ඩලයක් පත් කළ යුතු අතර ඒ ඡන්ද මණ්ඩලය විසින් ඒ සාමාජිකත්වය අවසානවීමෙන් සති හයක් ඇතුළත දී ඒ පුරප්පාඩුව පිරවීම පිණිස සාමාජිකයකු තෝරා පත්කර ගැනීම සඳහා අවශ්‍ය කටයුතු කළ යුතු ය. තව ද මණ්ඩලයක සාමාජිකයකු තෝරා පත් කර ගැනීමට අදාළව මේ පනතෙහි ඇති විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඒ සාමාජිකයා තෝරා පත්කර ගැනීම සම්බන්ධයෙන් අදාළ විය යුතු ය. පුරප්පාඩු පිරවීම.

(2) ඡන්ද මණ්ඩලයක් විසින්, සති හයක් ඇතුළත එකී කර්තව්‍ය ඉටු කිරීම පැහැර හරිනු ලැබුවහොත් කොමසාරිස්වරයා විසින් ඒ කර්තව්‍ය ඉටු කළ යුතු අතර මණ්ඩලය සම්බන්ධයෙන් වූ සඳහන් කිරීම කොමසාරිස්වරයා සම්බන්ධයෙන් වූ සඳහන් කිරීමක් වූවාක් මෙන් මේ පනතේ විධිවිධාන, ඒ තෝරා පත් කර ගැනීම කෙරෙහි අදාළ විය යුතු ය.

## III වන කොටස

### සේවක මණ්ඩලවල කටයුතු කරගෙන යාම

25. (1) මණ්ඩලය විසින් මණ්ඩලයේ සාමාජිකයන් අතුරින් දෙදෙනකු පිළිවෙළින් සභාපති සහ උපසභාපති වශයෙන් තෝරා පත් කර ගනු ලැබිය යුතු ය. මණ්ඩලයේ සභාපති සහ උපසභාපති.

(2) මණ්ඩලය, සේවා නියුක්තයන් වර්ග එකකට වැඩි ගණනක නියෝජිතයන්ගෙන් සමන්විතව ඇති අවස්ථාවක, සභාපති හා උපසභාපති යන දෙදෙනාම එකම වර්ගයකින් තෝරා පත් කර ගනු නොලැබිය යුතු ය.

(3) මණ්ඩලය විසින් අන්‍යාකාරයෙන් තීරණය කරනහොත් මිස, සභාපතිට ද ඔහුට ක්‍රියා කළ නොහැකි නම් උපසභාපතිට ද මණ්ඩල යේ අදහස් නියෝජනය කිරීමට හිමිකම තිබිය යුතු ය.

26. (1) මණ්ඩලය තෝරා පත්කර ගනු ලැබීමෙන් පසු එක් සතියකට වැඩි කාලයක් ගතවීමට පළමුව, 25 වන වගන්තිය යටතේ වූ තෝරා පත් කර ගැනීම් සඳහා ඡන්ද මණ්ඩලය විසින් මණ්ඩලයේ සාමාජිකයන් රැස් කළ යුතු ය. මණ්ඩලයේ රැස්වීම්.

(2) ඊට පසුව පවත්වනු ලබන මණ්ඩලයේ සියලුම රැස්වීම්, මණ්ඩලයේ සභාපති විසින් කැඳවනු ලැබිය යුතු ය.

(3) මණ්ඩලයේ රැස්වීම්වල න්‍යාය පත්‍රය පිළියෙල කිරීම ද මණ්ඩලයේ කටයුතු පවත්වා ගෙන යාම ද සභාපති විසින් කළ යුතු ය. මණ්ඩලයේ රැස්වීම් පිළිබඳව දින හතක දැනුම්දීමක් සභාපති විසින් සාමාජිකයන්ට දිය යුතු අතර ඒ රැස්වීම්වල න්‍යාය පත්‍රය පිළිබඳව ද ඔවුන්ට දැනුම්දිය යුතු ය.

(4) මණ්ඩලයේ සාමාජිකයන්ගෙන් හතරෙන් එකක් හෝ සේවා යෝජක හෝ විසින් කරනු ලබන ඉල්ලීමක් මත සභාපති විසින් මණ්ඩලයේ රැස්වීමක් කැඳවිය යුතු අතර සාකච්ඡාවකට භාජන කරන ලෙස ඉල්ලා සිටිනු ලැබ ඇති කාරණය රැස්වීමේ න්‍යාය පත්‍රයට ඇතුළත් කළ යුතු ය.

(5) සේවා යෝජකගේ ඉල්ලීම පිට කැඳවනු ලබන රැස්වීම්වලට පැමිණ සිටින ලෙස සේවා යෝජකට ද ආරාධනා කරනු ලැබිය යුතු ය.

මණ්ඩලයේ රැස්වීම්වල තීරණ.

27. (1) පැමිණ සිටින සහ ඡන්දය දෙන සාමාජිකයන්ගේ බහුතර සංඛ්‍යාවේ තීරණය මණ්ඩලයේ තීරණය විය යුතු ය.

(2) පක්ෂව හා විපක්ෂව ඇති ඡන්ද සංඛ්‍යාව සමාන අවස්ථාවක සභාපතිට තීරක ඡන්දයක් තිබිය යුතු ය.

(3) මණ්ඩලයේ සාමාජික සංඛ්‍යාවෙන් දෙකෙන් එක් පංගුවකින් මණ්ඩලයේ රැස්වීමක් සඳහා ගණපූරණය සමන්විත විය යුතු ය.

රැස්වීම්වල වාර්තා.

28. (1) මණ්ඩලයේ රැස්වීම්වල දී ගන්නා ලද සියලු තීරණවල සන්දර්භය හා එහි ලා ඡන්දය දුන් ආකාරය ද ඇතුළුව රැස්වීම්වල සියලු කටයුතු පිළිබඳ වාර්තාවක් තබා ගනු ලැබිය යුතු ය. ඒ වාර්තාවට සභාපති ද තවත් එක් සාමාජිකයකු ද අත්සන් තැබිය යුතු ය. පැමිණ සිටි සාමාජිකයන්ගේ ලැයිස්තුවක් වාර්තාවට ඇමිණිය යුතු ය. ඒ එක් එක් සාමාජිකයා විසින් ඒ ලැයිස්තුව අත්සන් කරනු ලැබිය යුතු ය.

(2) රැස්වීමකට සේවා යෝජක පැමිණ සිටින අවස්ථාවක, වාර්තාවේ ඔහුට අදාළ කොටස අත්සන සඳහා ඔහු වෙත ඉදිරිපත් කළ යුතු අතර එහි පිටපතක් ද ඔහුට දිය යුතු ය.

තීරණ කල් දැමීම.

29. (1) මණ්ඩලයේ යම් තීරණයක් නිසා තමන් නියෝජනය කරන සේවා නියුක්තයන්ගේ සම්බන්ධතාවන්ට සැලකිය යුතු තරම් හානියක් වන බව යම් එක් සේවා නියුක්තයන් වර්ගයක නියෝජිතයන් බහුතර සංඛ්‍යාවකගේ මතය වන්නේ නම්, එකඟත්වයකට පත් වීමට ප්‍රයත්නයක් දැරිම හැකි වනු පිණිස ඒ තීරණය ඔවුන් විසින් කරනු ලබන ඉල්ලීමක් මත, එක් සතියක කාලයක් සඳහා කල් තබනු ලැබිය හැකි ය.

(2) එවැනි යම් තීරණ වෙනුවෙන් කල්තැබීම් එකකට වැඩි ගණනකට ඉඩ දෙනු නොලැබිය හැකි ය.

ස්ථාවර නියෝග.

30. (1) මේ කොටසේ විධිවිධානවලට යටත් ව මණ්ඩලය විසින්, එහි කටයුතු කරගෙන යාම සම්බන්ධයෙන් ස්ථාවර නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) ඒ ස්ථාවර නියෝග කොමසාරිස්වරයා විසින් අනුමත කරනු ලැබූ විට බලාත්මක විය යුතු ය.

මණ්ඩලයේ සාමාජිකයන්ට අමතර පාරිශ්‍රමික නොලැබෙන බව.

31. මණ්ඩලයේ සාමාජිකයකු වශයෙන් තමා විසින් ඉටු කරනු ලබන කර්තව්‍ය වෙනුවෙන් යම් පාරිශ්‍රමිකයක් හෝ දීමනාවක් ගෙවනු ලැබීමට මණ්ඩලයේ කිසිම සාමාජිකයකු හිමිකම් නොලැබිය යුතු ය.

32. (1) නිශ්චිත ව්‍යාපාරයක මණ්ඩලයේ සාමාජිකයකු වන සෑම සේවා නියුක්තයකුට ම, මණ්ඩලයේ සාමාජිකයකු වශයෙන් ස්වකීය කර්තව්‍ය හා කාර්ය නිසි පරිදි ඉටු කිරීම සඳහා යුක්ති සහගතව අවශ්‍ය විය හැකි යම් කාලපරිච්ඡේද සඳහා වැටුප් අහිමි වීමක් නොමැතිව නිවාඩු ඔහුගේ සේවා යෝජක විසින් දෙනු ලැබිය යුතු ය.

මණ්ඩලයේ සාමාජිකයන්ට නිවාඩු දීම සේවා යෝජකයන්ගේ යුතුකම බව.

(2) වැඩ කරන කාලය ඇතුළත, කලින් වේලාවක් නියම කර ගෙන මණ්ඩලය විසින් හෝ එහි නියෝජිතයන් විසින් හෝ මණ්ඩලයේ කටයුතුවලට අදාළ යම් කාරණයක් සම්බන්ධයෙන් සේවා යෝජක සමග සාකච්ඡා පවත්වනු ලැබිය හැකි ය.

(3) යම් නිශ්චිත ව්‍යාපාරයක මණ්ඩලය විසින්, ඒ මණ්ඩලයේ කර්තව්‍ය හා කාර්ය ඉටු කිරීමෙහි ලා දරන ලද යම් වියදමක් සේවා යෝජක විසින් ගෙවනු ලැබිය යුතු ය.

(4) මණ්ඩලයේ කටයුතු කරගෙන යාම සඳහා අවශ්‍ය ස්ථානය හා පහසුකම් සේවායෝජක විසින් සපයා දිය යුතු ය.

33. (1) මණ්ඩලය විසින් එහි කටයුතු පිළිබඳ වාර්තාවක් සෑම මාස තුනකට වරක් පළ කරනු ලැබිය යුතු ය.

මණ්ඩලයේ කටයුතු පිළිබඳ වාර්තාවක් පළ කිරීම.

(2) ඒ එක් එක් වාර්තාවේ පිටපතක් සේවා යෝජක වෙත සපයනු ලැබිය යුතු ය.

## IV වන කොටස

## සේවක මණ්ඩලවල අරමුණු හා කර්තව්‍ය

34. මණ්ඩලයේ අරමුණු පහත දැක්වෙන පරිදි විය යුතු ය:—

මණ්ඩලයේ අරමුණු.

(අ) නිශ්චිත ව්‍යාපාරයේ කටයුතුවලට සේවා නියුක්තයන්ගේ ඵලදායී සහභාගිත්වය වර්ධනය කිරීම සහ ඒ සහභාගිත්වය පවත්වාගෙන යාම;

(ආ) නිශ්චිත ව්‍යාපාරයේ කාර්මික සාමය සහ වැඩි කාර්යක්ෂමතාවක් හා ඵලදාවක් ඇති කිරීමෙහි ලා සහ ඊට සම්බන්ධ කාරණාවල දී සේවා නියුක්තයන් සහ සේවා යෝජක අතර අන්‍යොන්‍ය සහයෝගිතාව සුරක්ෂිත කිරීම; සහ

(ඇ) අමාත්‍යවරයා විසින් නියෝග මගින් නියම කරනු ලැබිය හැකි වෙනත් යම් කාරණා.

35. (1) සමාජයේ යහපත කෙරෙහි නිසි සැලකිල්ල දක්වමින්, නිශ්චිත ව්‍යාපාරයේ සහ එහි සේවා නියුක්තයන්ගේ යහපත උදෙසා අන්‍යොන්‍ය විශ්වාසයෙන් යුතුව සහයෝගයෙන් වැඩ කිරීම සේවා යෝජකගේ හා මණ්ඩලයේ යුතුකම විය යුතු ය.

සේවා යෝජක හා මණ්ඩලය අතර සම්බන්ධතාව.

(2) නිශ්චිත ව්‍යාපාරයේ සේවයෙහි නියුක්ත සෑම තැනැත්තකුට ම නීතියේ මූලධර්මවලට අනුකූලව සාධාරණ ලෙස සලකන බවට සේවා යෝජක හා මණ්ඩලය වග බලාගත යුතු ය.

(3) නිශ්චිත ව්‍යාපාරයේ කාර්යක්ෂමතාවට හා නිෂ්පාදන ශක්තියට හානියක් සිදුවීමට ඉඩ ඇති කිසිවක් කිරීමෙන් සේවා යෝජක හා මණ්ඩලය වැළකී සිටිය යුතු ය.

මණ්ඩලයේ කාර්ය.

36. මණ්ඩලයේ සාමාන්‍ය කාර්යයන්ට පහත දැක්වෙන කාර්ය ඇතුළත් විය යුතු ය :—

(අ) ව්‍යාපාරයට හා සේවානියුක්තයන්ට ඵලදායී වන කාරණා සම්බන්ධයෙන් සේවා යෝජකට නිර්දේශ ඉදිරිපත් කිරීම ;

සහ

(ආ) සේවා නියුක්තයන්ට බලපාන යම් ලිඛිත නීතියක් ක්‍රියාත්මක කෙරෙන බවට වගබලා ගැනීම.

ඇතැම් තොරතුරු ලබා ගැනීමට මණ්ඩලයට හිමිකම් ඇති බව.

37. නිශ්චිත ව්‍යාපාරයට අදාළ පහත දැක්වෙන කාරණා සම්බන්ධයෙන් සේවා යෝජකගෙන් තොරතුරු ද නිශ්චිත ව්‍යාපාරයේ සේවයෙහි නියුක්ත යම් තැනැත්තකුගෙන් උපදෙස් ද ලබා ගැනීමට මණ්ඩලයට හිමිකම තිබිය යුතු ය :—

(අ) නිපදවීමේ ක්‍රම සහ පොදු ස්වභාවයක වූ වැඩ ;

(ආ) ව්‍යාපාරයේ මුදල් ගිණුම් පිළිබඳ ප්‍රකාශය ; සහ

(ඇ) මේ පනතේ විධිවිධාන යටතේ සාකච්ඡා කිරීමට මණ්ඩලයට හිමිකම ඇත්තේ වෙනත් යම් කාරණා සම්බන්ධයෙන් ද ඒ කාරණා :

එසේ වුව ද යම් තොරතුරු හා උපදෙස් සැපයීම ව්‍යාපාරයේ කටයුතුවලට හෝ වෙනත් සම්බන්ධතාවන්ට අගතිදායක වන්නේ නම් එවැනි තොරතුරු හා උපදෙස් ලබා ගැනීමට මණ්ඩලයට හිමිකමක් නොතිබිය යුතු ය.

සේවා යෝජක හා මණ්ඩලය අතර පැවැත්වෙන රැස්වීම.

38. (1) සේවා යෝජක සහ මණ්ඩලය සෑම මාසයක ම එක් වරක් රැස්විය යුතු ය.

(2) ඒ රැස්වීම්වල දී තමා නියෝජනය කිරීම සඳහා තැනැත්තන් පස්දෙනකුට නොවැඩි සංඛ්‍යාවක් සේවා යෝජක විසින් නම් කරනු ලැබිය හැකි ය.

(3) මේ පනතේ විධිවිධාන උල්ලංඝනය කිරීමක් සිදු කර ඇතැයි කියනහොත් එය ද ඇතුළුව ආරාවුලට විෂය වී ඇති සෑම කාරණයක් ම බේරුම් කර ගැනීමේ අදහස ඇතිව සේවා යෝජක සහ මණ්ඩලය විසින් සාකච්ඡා පවත්වනු ලැබිය යුතු ය.

(4) ආරාවුලට විෂය වී ඇති යම් කාරණයක් පිළිබඳව සේවා යෝජක සහ මණ්ඩලය අතර ඇති කර ගන්නා යම් බේරුම් කර ගැනීමකින් සේවා යෝජක ද මණ්ඩලය ද නිශ්චිත ව්‍යාපාරයේ සේවා නියුක්තයන් ද බැඳී සිටින්නා හ.

කොමසාරිස්වරයා ඉදිරියෙහි පැවැත්වෙන කටයුතු.

39. (1) ආරාවුලක් සේවක මණ්ඩලය හා සේවා යෝජක අතර බේරුම්කර ගනු නොලැබූ අවස්ථාවක, සේවා යෝජක හෝ සේවක මණ්ඩලය හෝ විසින් ඒ ආරාවුල බේරුම් කිරීම සඳහා කොමසාරිස් වරයා වෙත යොමු කරනු ලැබිය හැකි ය.

(2) සේවා යෝජකට, සේවක මණ්ඩලයට හා ස්වකීය සාමාජික යන් වෙනුවෙන් ක්‍රියා කරන යම් වෘත්තීය සමිතියකට කොමසාරිස් වරයා ඉදිරියෙහි වූ කටයුතුවලට සහභාගි වීමට හිමිකම් තිබිය යුතු ය.

කොමසාරිස්වරයා ඉදිරියෙහි වූ බේරුම් කිරීම අනුගමය බව.

40. කොමසාරිස්වරයා ඉදිරියෙහි වූ බේරුම් කිරීමකින් සේවා යෝජක ද සේවක මණ්ඩලය ද නිශ්චිත ව්‍යාපාරයේ සේවා නියුක්ත යන් ද බැඳී සිටින්නා හ.

ව්‍යාපාරයේ කළමනාකරණ යෙහි ලා මණ්ඩලය හෝ මණ්ඩලයේ සාමාජිකයකු හෝ මැදිහත් නොවිය යුතු බව.

41. මණ්ඩලය හෝ මණ්ඩලයේ යම් සාමාජිකයකු හෝ විසින් යම් ඒකපාර්ශ්වික ක්‍රියාවක් මගින් නිශ්චිත ව්‍යාපාරයේ කළමනා කරණයෙහි ලා මැදිහත් නොවිය යුතු ය.

මණ්ඩලයේ සාමාජිකයකුට අවහිර කිරීම හෝ බාධා කිරීම වරදක් බව.

42. (1) ස්වකීය කර්තව්‍ය ඉටු කිරීමෙහි ලා මණ්ඩලයේ සාමාජික යකුට කිසිම තැනැත්තකු විසින් අවහිර කිරීම හෝ බාධා කිරීම හෝ නොකළ යුතු ය.

(2) ස්වකීය කර්තව්‍ය ඉටු කිරීමෙහි ලා මණ්ඩලයේ සාමාජිකය කුට අවහිර කරන හෝ බාධා කරන යම් තැනැත්තෙක් මේ පනත යටතේ වරදක් කරන්නේ ය.

මණ්ඩලයේ සාමාජිකයකුට අගතියක් හෝ විශේෂ සැලකිල්ලක් නොකළ යුතු බව.

43. මණ්ඩලයේ සාමාජිකයකුට, ඔහු විසින් ඒ සාමාජිකයා වශ යෙන් ස්වකීය කර්තව්‍ය ඉටු කිරීමෙහි ලා කරන ලද යම් ක්‍රියාවක් හෝ දෙයක් හේතුවෙන්, සේවා යෝජක විසින් අගතියක් හෝ විශේෂ සැලකිල්ලක් හෝ නොකළ යුතු ය.

හදිසි අනතුරු, අවදානම් ආදිය සම්බන්ධයෙන් මණ්ඩලය සතු අයිතිවාසිකම්.

44. (අ) නිශ්චිත ව්‍යාපාරය පැවැත්වෙන භූමි සීමාවෙහි—

(i) ආරක්ෂා විධිවිධාන සැලැසීමෙන් හදිසි අනතුරු සිදුවීම වැළැක්වීම සඳහා ද

(ii) යම් සෞඛ්‍ය උපද්‍රව තුරන් කිරීම සඳහා ද ප්‍රමාණවත් පියවර ගැනීමට සේවා යෝජකට උපදෙස් දීමට සහ සහාය වීමට;

(ආ) උපදෙස් සඳහා මණ්ඩලය වෙත යොමු කරනු ලබන යම් කාරණා සම්බන්ධයෙන් ආණ්ඩුවේ දෙපාර්තමේන්තු වලට සහ වෙනත් ආයතනවලට තොරතුරු හා උප දෙස් සැපයීමට; සහ

(ඇ) කාර්මික හදිසි අනතුරු වැළැක්වීම සඳහා අවශ්‍ය සියලු විධිවිධාන ක්‍රියාත්මක කිරීම උනන්දු කරවීමට

මණ්ඩලයට අයිතිවාසිකම් තිබිය යුතු ය.

සාකච්ඡා කිරීමේ අයිතිවාසිකම මණ්ඩලය සතුව ඇති බව.

45. (1) නිශ්චිත ව්‍යාපාරයට අදාළ මෙහි පහත දැක්වෙන කාරණා යම් ලිඛිත නීතියක් මගින් නිශ්චය කර නොමැති තාක් දුරට, ඒ කාරණා පිළිබඳව සේවා යෝජක සමග සාකච්ඡා කිරීමට මණ්ඩලයට අයිතිවාසිකම තිබිය යුතු ය:—

(අ) වැඩ කරන වේලාවන්, සේවා මුර අනුව වැඩ කරන කම්කරුවන්ගේ වාරචක්‍ර පිළියෙල කිරීම සහ කෑම ගැනීමේ සහ විවේක ගැනීමේ විරාම කාල ;

(ආ) වේතන සහ වෙනත් පාරිශ්‍රමික ගෙවන වේලාව සහ ස්ථානය ;

(ඇ) වාර්ෂික නිවාඩු උපලේඛනය පිළියෙල කිරීම ;

(ඈ) වෘත්තිය පුහුණුව ලබාදීම ;

(ඉ) ශුභසාධක, විනෝද සහ සමාජ කටයුතු පිළිබඳ පරිපාලනය ;

(ඊ) යථා පැවැත්ම හා විනය සහ සේවා නියුක්තයන්ගේ හැසිරීම පවත්වාගෙන යාම හා සම්බන්ධ කාරණා ;

(උ) සුදුසුකම් ලත් සේවා නියුක්තයන් මාරු කිරීම සහ ඔවුන් සේවයෙන් පහ කිරීම පිළිබඳ කාරණා ;

(ඌ) ආරක්ෂාව සහ වෘත්තිය උපද්‍රව හා සම්බන්ධ කාරණා.

(2) (අ) සේවා නියුක්තයකුගේ සේවා නියුක්තියෙහි නියම හා කොන්දේසිවල කිසි වෙනසක් නොමැතිව ඔහුට එකම ව්‍යාපාරයේ වෙනස් ස්වභාවයකින් යුත් වැඩක් කිරීමට පැවරීම, ඒ පැවරීම හේතුකොටගෙන ඔහු විඩා අඩු වැසිදායක තත්ත්වයක පිහිටුවීමක් සිදු නොවේ නම්, මාරු කිරීමක් ලෙස සලකනු නොලැබිය යුතු ය.

(ආ) තමන්ගේ සේවා නියුක්තියේ හෝ නිලයේ ස්වභාවය හේතු වෙන් තමන්ගේ කාර්ය යම් එක් ස්ථානයක සිදු නොකරන සේවා නියුක්තයන් සම්බන්ධයෙන් වන විට, වැඩ කළ යුතු ස්ථානය වෙනස් කිරීම, මේ වගන්තියේ අර්ථානුකූලව මාරු කිරීමක් ලෙස සලකනු නොලැබිය යුතු ය.

## V වන කොටස

### පාලක මණ්ඩලවල නියෝජනය

නිශ්චිත ව්‍යාපාරවල සේවා නියුක්තයන් පාලක මණ්ඩලවලට පත් කිරීම සම්බන්ධයෙන් නියෝග සාදනු ලැබිය හැකි බව.

46. නිශ්චිත ව්‍යාපාරවල සේවා නියුක්තයන් පාලක මණ්ඩලවලට පත් කිරීම නැතහොත් තෝරා පත් කිරීම ද ඔවුන්ගේ ධුර කාලය සහ ඔවුන්ට අදාළ නියම හා කොන්දේසි ද සඳහා විධිවිධාන සලසමින් හා ඉහත කී කරුණුවලට සම්බන්ධ හෝ ආනුෂංගික කාරණා සම්බන්ධයෙන් නියෝග සාදනු ලැබිය හැකි ය.

## VI වන කොටස

### පොදු විධිවිධාන

කොමසාරිස්වරයා විසින් හෝ ඔහු විසින් බලය දෙනු ලැබූ නිලධරයකු විසින් හෝ සේවායෝජකට විධාන නිකුත් කළ හැකි බව.

47. කොමසාරිස්වරයා විසින් හෝ ඔහු විසින් නම් කරනු ලැබූ යම් නිලධරයකු විසින් හෝ විධානයක් මගින්, ඒ විධානයෙහි නිශ්චිතව සඳහන් දිනයකට පෙර—

(අ) ඒ සේවා යෝජකගේ සියලුම සේවා නියුක්තයන් පිළිබඳව හෝ ඔවුන් අතුරින් සේවා නියුක්තයන් කිසිවකු පිළිබඳව හෝ ඒ විධානයෙහි නිශ්චිතව සඳහන් යම් විස්තර ඇතුළත් වාර වාර්තාවක් ;

(ආ) ඒ සේවා යෝජක විසින් සපයන ලද යම් වාර වාර්තාවක සඳහන් යම් විස්තර පිළිබඳව ඒ විධානයෙහි නිශ්චිතව සඳහන් යම් තොරතුරක් හෝ පැහැදිලි කිරීමක් ; සහ

(ඇ) ඒ සේවා යෝජක විසින් තබාගත යුතු යයි මේ පනතින් නියමිත යම් ලේඛනයක හෝ ඒ ලේඛනයේ යම් කොටසක හෝ සැබෑ පිටපතක්

කොමසාරිස්වරයාට හෝ එකී නිලධරයාට හෝ සපයන ලෙස සේවා යෝජකට විධාන කළ හැකි ය.

48. (අ) මේ පනතේ විධිවිධාන අතුරින් යම් විධිවිධානයක් කඩ කරන හෝ ඒ අනුව ක්‍රියා කිරීම පැහැර හරින ; හෝ

වැරදි හා දණ්ඩන.

(ආ) මේ පනත යටතේ දෙන ලද යම් විධානයක් හෝ කරන ලද යම් නියමයක් අනුව ක්‍රියා කිරීම පැහැර හරින ; හෝ

(ඇ) මේ පනතේ 47 වන වගන්තිය යටතේ සැපයීමට නියමිත යම් වාර වාර්තාවක් හෝ තොරතුරක් ඒ වාර්තාව හෝ තොරතුර අසත්‍ය බව දැන දැනම සප යන නැතහොත් සැපයීමට සලස්වන

සෑම තැනැත්තෙක් ම වරදක් කරන අතර මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි වරදකරු කරනු ලැබූ විට, රුපියල් එක් දහසක් නො ඉක්මවන දඩයකට හෝ මාස හයක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ ඒ තැනැත්තා යටත් විය යුතු ය.

49. දණ්ඩනයක් නියම කර නොමැති මේ පනත යටතේ වූ වරදක් සම්බන්ධයෙන් වරදකරුවකු වන සෑම තැනැත්තෙක් ම රුපියල් එක් දහසක් නොඉක්මවන දඩයකට හෝ එක් අවුරුද්දක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ යටත් විය යුතු ය.

දණ්ඩනයක් නියම කර නොමැති වරදක් සම්බන්ධයෙන් දණ්ඩනය.

50. පුද්ගල මණ්ඩලයක් විසින් සිදු කරන ලද මේ පනත යටතේ වූ යම් වරදක් සම්බන්ධයෙන් වන විට—

සංස්ථාගත කරන ලද හෝ සංස්ථාගත කරනු නොලැබූ පුද්ගල මණ්ඩල විසින් සිදු කරන ලද වැරදි සම්බන්ධයෙන් ඇතැම් තැනැත්තන්ගේ වගකීම.

(අ) ඒ පුද්ගල මණ්ඩලය සංස්ථාගත මණ්ඩලයක් වන අවස්ථාවක, ඒ සංස්ථාගත මණ්ඩලයේ සෑම අධ්‍යක්ෂවරයෙක් ම සහ නිලධරයෙක් ම ;

(ආ) ඒ පුද්ගල මණ්ඩලය ව්‍යාපාරික ආයතනයක් වන අවස්ථාවක, ඒ ව්‍යාපාරික ආයතනයේ සෑම හවුල්කරුවෙක් ම ;

(ඇ) ඒ පුද්ගල මණ්ඩලය සංස්ථාගත කරනු නොලැබූ මණ්ඩලයක් වන අවස්ථාවක, ඒ සංස්ථාගත කරනු නොලැබූ මණ්ඩලයේ සභාපති, කළමනාකරු, ලේකම් සහ වෙනත් සෑම නිලධරයෙක් ම

වරදකට වරදකරු යයි සලකනු ලැබිය යුතු ය.

සේවක මණ්ඩලවල සාමාජිකයන් සේවා නියුක්තයන් විසින් කරනු ලබන පළිගැනීම් වලින් ආරක්ෂා කිරීම.

51. සේවක මණ්ඩලයේ සාමාජිකයකු වන යම් සේවා නියුක්ත යකු මේ පනතේ විධිවිධානවලට අනුකූලව ක්‍රියා කරන තාක් දුරට, සේවක මණ්ඩලයේ සාමාජිකයකු වශයෙන් ඔහුගේ තත්ත්වය හා කටයුතු පදනම් කොට ගෙන, කිසිම සේවා යෝජකයකු විසින් ඒ සේවා නියුක්තයාට හානිකර වන යම් ක්‍රියාවක් කරනු නොලැබිය යුතු ය.

කොමසාරිස් වරයාගේ අනුමතය නොමැතිව වරදක් සම්බන්ධයෙන් කිසිම නඩු පැවරීමක් නොකළ යුතු බව.

52. මේ පනත යටතේ වූ වරදක් සම්බන්ධයෙන් කොමසාරිස් වරයා විසින් හෝ ඔහුගේ ලිඛිත අනුමතය ඇතිව හෝ හැර කිසිම නඩු පැවරීමක් නොකළ යුතු ය.

නඩුවක් පැවරීම සිවිල් නඩුවකට බාධාවක් නොවන බව.

53. මේ පනත යටතේ වූ වරදක් සම්බන්ධයෙන් යම් තැනැත්තකුට විරුද්ධව මේ පනත යටතේ පවරා ඇති කිසිම නඩුවක්, මේ පනත නිසා උද්ගත වන යම් කාරණයක් සම්බන්ධයෙන් ඒ තැනැත්තාට විරුද්ධව පවරන ලද යම් සිවිල් නඩුවකට බාධාවක් නොවිය යුතු ය.

නියෝග.

54. (1) මේ පනතේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ හෝ විධිවිධාන බලගැන්වීමේ කාර්යය සඳහා අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) විශේෂයෙන් ම හා (1) වන උපවගන්තියෙන් පවරා ඇති බලතලවල ව්‍යාප්තියට හානියක් නොමැතිව නියම කළ යුතු යයි මේ පනතින් ප්‍රකාශිත හෝ නියමිත වැනහොත් සෑදීමට බලය දී ඇති කාරණා සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය.

(3) මේ පනත යටතේ අමාත්‍යවරයා විසින් සාදනා ලද සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර එසේ පළ කරනු ලැබූ විට හෝ නියෝගයෙහි සඳහන් යම් පසු දිනයක හෝ එය ක්‍රියාත්මක විය යුතු ය.

(4) අමාත්‍යවරයා විසින් සාදනා ලද සෑම නියෝගයක් ම, එය ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබූ දිනයෙන් පසු හැකි පහසු ඉක්මණින් අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එසේ අනුමත කරනු නොලැබූ යම් නියෝගයක්, එහි අනනුමතයේ දින සිට ප්‍රත්‍යාදිෂ්ට කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු නමුත් ඒ යටතේ කලින් කරන ලද කිසිවකට ඉන් හානියක් නොවිය යුතු ය.

(5) අමාත්‍යවරයා විසින් සාදනු ලැබූ යම් නියෝගයක් පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුත්තේ යම් දිනයක සිට ද, ඒ දිනය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

අර්ථ නිරූපණය.

55. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මේ පනතෙහි—

"අනියම් සේවා නියුක්තයා" යන්නෙන්, යම් සේවා යෝජකයකු විසින්, අනියම් ස්වභාවයක වූ වැඩ කිරීම සඳහා යම් වර්ෂයක් තුළ මුළු එකතුව එකසිය අසූවකට වැඩි නොවන දින ගණනක් සේවයෙහි නියුක්ත කරවනු ලැබූ යම් සේවා නියුක්තයෙක් අදහස් වේ;

"ආරාවුලකට විෂය වී ඇති කාරණය" යන්නට, යම් කාර්මික ආරාවුලක් ද ඇතුළත් වේ;

"කාර්මික ආරාවුල" යන්නෙන්, යම් තැනැත්තකු සේවයෙහි නියුක්ත කිරීම නැතහොත් සේවයෙහි නියුක්ත නොකිරීම හෝ යම් තැනැත්තකුගේ සේවා නියුක්තියට අදාළ නියම හෝ සේවා තත්ත්වයන් හෝ සේවා නියුක්තිය අවසන් කිරීම හෝ යම් තැනැත්තකු සේවා නියුක්තියෙහි නැවත පිහිටුවීම හා සම්බන්ධව සේවා යෝජකයකු සහ සේවා නියුක්තයකු අතර නැතහොත් සේවා යෝජකයන් සහ සේවා නියුක්තයන් අතර වූ යම් ආරාවුලක් හෝ මත භේදයක් අදහස් වේ;

"කොමසාරිස්වරයා" යන්නෙන්, තත්කාලයෙහි කම්කරු කොමසාරිස් ධුරය දරන තැනැත්තා අදහස් වන අතර—

(අ) තත් කාලයෙහි නියෝජ්‍ය හෝ ජ්‍යෙෂ්ඨ සහකාර කම්කරු කොමසාරිස් ධුරය නැතහොත් සහකාර කම්කරු කොමසාරිස් ධුරය දරන යම් තැනැත්තෙක් ද,

(ආ) මේ පනත යටතේ කොමසාරිස්වරයාගේ බලතල, කාර්ය හෝ කර්තව්‍ය සම්බන්ධයෙන් වන විට, ඒ බලතල ක්‍රියාත්මක කිරීමට, කාර්ය කිරීමට හෝ කර්තව්‍ය ඉටු කිරීමට කොමසාරිස්වරයා විසින් ලියවිල්ලකින් බලය දෙනු ලැබූ යම් තැනැත්තෙක් ද

ඊට ඇතුළත් වේ;

"තාවකාලික සේවා නියුක්තයා" යන්නෙන්, යම් සේවා යෝජකයකු විසින්, තාවකාලික ස්වභාවයක වූ වැඩ කිරීම සඳහා යම් වර්ෂයක් තුළ, මුළු එකතුව එකසිය අසූවකට වැඩි නොවන දින ගණනක් තාවකාලිකව සේවයෙහි නියුක්ත කරවනු ලැබූ යම් සේවා නියුක්තයෙක් අදහස් වේ;

"පාලක මණ්ඩලය" යන්නෙන්, එය නිශ්චිත ව්‍යාපාරයක් සම්බන්ධයෙන් යොදනු ලැබූ විට ඒ ව්‍යාපාරයේ අධ්‍යක්ෂ මණ්ඩලය හෝ, කවර නාමයකින් හඳුන්වනු ලැබුව ද, ඒ ව්‍යාපාරයේ කළමනාකරණය සහ පරිපාලනය පිළිබඳව පාලන බලය දරන වෙනත් පුද්ගල මණ්ඩලයක් හෝ ඉන් අදහස් වේ;

"රාජ්‍ය සංස්ථාව" යන්නෙන්, සමාගම් ආඥාපනත යටතේ හැර වෙනත් යම්කිසි ලිඛිත නීතියකින් හෝ ලිඛිත නීතියක් යටතේ හෝ පිහිටුවනු ලද්දා වූ ද ආණ්ඩුව විසින් ප්‍රදානයක් හෝ ණයක් වශයෙන් නැතහොත් වෙනත්

ආකාරයකින් මුළු අරමුදල හෝ මුළු ප්‍රාග්ධනය නැතහොත් අරමුදලෙන් කොටසක් හෝ ප්‍රාග්ධනයෙන් කොටසක් හෝ සපයනු ලබන්නා වූ ද සංස්ථාවක්, මණ්ඩලයක් හෝ වෙනත් ආයතනයක් අදහස් වේ ;

"රාජ්‍ය ව්‍යාපාරය" යන්නෙන්, යම් රාජ්‍ය සංස්ථාවක් හෝ යම් ලිඛිත නීතියක් යටතේ ආණ්ඩුවට පවරා ගනු ලැබ ඇති යම් වෙළෙඳ ව්‍යාපාරයක් හෝ එවැනි සංස්ථාවක නැතහොත් වෙළෙඳ ව්‍යාපාරයක යම් ශාඛාවක් හෝ කොටසක් හෝ අදහස් වේ ;

"වේතනය" යන්නෙන්, යම් සේවා නියුක්තයකු විසින් ස්වකීය සේවා නියුක්තියේ නියම හා කොන්දේසිවලට අනුකූලව උපයා ගන්නා ලද පාරිශ්‍රමිකය අදහස් වන අතර ජීවන වියදම් දීමනාවක් හෝ විශේෂ ජීවනාධාර දීමනාවක් ඊට ඇතුළත් වන නමුත් යම් ප්‍රසාද මුදලක් හෝ අතිකාල ගෙවීමක් ඊට ඇතුළත් නොවේ ;

"සුදුසුකම් ලත් සේවා නියුක්තයා" යන්නෙන්, අනියම් සේවා නියුක්තයකු හෝ තාවකාලික සේවා නියුක්තයකු හෝ කළමනාකරණ හෝ අධීක්ෂණ තත්ත්වයක සේවයෙහි නියුක්ත කර සිටින සේවා නියුක්තයකු නොවන යම් සේවා නියුක්තයෙක් අදහස් වේ ;

"සේවා යෝජක" යන්නෙන්, යම් සේවා නියුක්තයකු සේවයෙහි නියුක්ත කරනු ලබන්නේ යම් තැනැත්තකු විසින් ද ඒ තැනැත්තා හෝ යම් සේවා නියුක්තයකු වෙනත් යම් තැනැත්තකු විසින් සේවයෙහි නියුක්ත කරනු ලබන්නේ යම් තැනැත්තකු වෙනුවෙන් ද ඒ තැනැත්තා හෝ අදහස් වන අතර (සංස්ථාගත කරන ලද හෝ සංස්ථාගත නොකරන ලද) සේවා යෝජක මණ්ඩලයක් ද යම් සේවා නියුක්තයකු සේවයෙහි නියුක්ත කරනු ලබන්නේ වෙනත් යම් තැනැත්තකු වෙනුවෙන් යම් තැනැත්තකු විසින් ද ඒ තැනැත්තා ද ඊට ඇතුළත් වේ.